# ජාතකට්ඨ කථා හා පඤ්චතන්ත්‍රය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

## (තෝරාගත් කථා කිහිපයක් ආශ්‍රයෙන්)

තිඹිරිවැව සිරිසුමන හිමි[1], පැපිලියවල නාරද හිමි[2]

### හැඳින්වීම

නවංග සත්ථු සාසනය බුද්ධ භාෂිතයේ මූලික බෙදීමකි. එයින් හත්වැන්න ජාතක යි. බුදුරජාණන් වහන්සේගේ පූර්ව ජන්ම ගත තොරතුරු ඉන් විවරණය වේ. මුල් බුදුසමයේ පැණෙන ජාතක ගාථාවලට අර්ථ විවරණ සැපයීම සිදු කෙරෙන්නේ ජාතකට්ඨ කථාවෙනි. මහින්දාගමනයෙන් පසු ව ජාතකට්ඨ කථාව හෙළුවට පෙරළුණු අතර ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ දී පමණ බුදුගොස් හිමියෝ එය නැවත පෙළ බසට නැගූහ. කුරුණෑගල යුගයේ දී පන්සිය පනස් ජාතක පොත් වහන්සේ නමින් හෙළු බසට පෙරළන ලද්දේ බුද්ධඝෝෂ හිමියන් විසින් විරචිත මෙකී ජාතකට්ඨ කථාව යි. ජාතක පාලිය බුදුරජාණන් වහන්සේ ධරමාන අවධියට අයත් කළ හැක්කේ නමුදු ජාතකට්ඨ කථාවට මෙන් ම සිංහල පන්සිය පනස් ජාතක පොත් වහන්සේට ද පසුකාලීන ව කථා වස්තු එකතු වූ බවට සාධක තිබේ. ජාතක කතාවන්ගේ මූලික අරමුණ වූයේ සදාචාරය සහ සදුපදේශය ලබාදීම යි.

සදුපදේශ ලබා දීම අරමුණු කොට ගනිමින් භාරත සාහිත්‍යයෙන් හමු වන එක ම සාහිත්‍යාංගය ජාතක නොවේ. එය වූකලී සමස්ත භාරත උපදේශ සාහිත්‍යයේ එක් අංශු මාත්‍රයක් පමණි. ආදි ම ඉන්දියානුවෝ පවා ස්වභාව සෞන්දර්ය ඉතා ළඟින් ඇසුරු කොට ගනිමින් යම් කිසි දෙයක් අවධාරණයෙන් ප්‍රකාශ කරනු පිණිස උපදේශ කථා, උපමා, ප්‍රස්තාව පිරුළු ආදිය යොදා ගෙන හැර දැක්වූහ. මේ හේතුවෙන් කල් යත් ම එය උපදේශ සාහිත්‍යයක් දක්වා වර්ධනය විය. මෙහි ආරම්භය වෛදික යුගය තෙක් ම දිව යන අතර වෛදික යුගයේ දක්නට ලැබෙන පුරූරුවස් ඌර්වශී ආඛ්‍යානය, ශුනඃශේඵ ආඛ්‍යානය මෙන් ම ඍග් වේදයේ සඳහන් වන වැසි සමය ආරම්භයේ කෑ ගසන මැඩියා යාගයට උත්සහවත් වන බමුණන්ට සමාන කරමින් උපමා කර ඇති ගීය හා ඡාන්දෝග්‍ය උපනිෂදයේ සඳහන් සුනඛයන් පිළිබඳ දෘෂ්ටාන්තය (බලු රැළකට නායකයකු සෙවීමේ අදහස) මෙම සාහිත්‍යය සඳහා මූලාධාර වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

බෞද්ධ උපදේශ කථා සාහිත්‍යයේ ජාතක කථා යම් සේ ජනප්‍රිය වූයේ ද සංස්කෘත උපදේශ කථා සාහිත්‍යයේ ද විෂ්ණු ශර්මන්ගේ පඤ්ච තන්ත්‍රය ඒ ලෙස ම ජනප්‍රිය ව තිබිණ. මිත්‍රභේද, මිත්‍රසම්ප්‍රාප්ති, කාකෝලූකීය, ලබ්දප්‍රණාශ හා

---

[1] සහය කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
[2] බෞද්ධ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

අපරීක්ෂිතකාරක යන තන්ත්‍ර පඤ්චකයකින් පරිමිත තත් කෘතිය අමරශක්ති රජුගේ බහුශක්ති, උග්‍රශක්ති හා අනන්තශක්ති නම් වූ අතිශය දුර්බුද්ධි රාජ කුමාරවරුන් තිදෙනාගේ ඥානාභිවර්ධනය උදෙසා ප්‍රණීත ය. පසු ව මාස හයක් තරම් කෙටි කාලයක දී රාජ කුමාරවරු තිදෙනා ම සකලශාස්ත්‍ර විද්‍යා විෂයෙහි පරතෙරට පත් වූහ. විෂ්ණු ශර්මන් සිය කෘතිය රාජ කුමාරවරුන්ගේ විනෝදය සඳහා රාජ නීති හා ධර්ම නීති ශාස්ත්‍රය පිළිබඳ උපදෙස් කථා ව්‍යාජයෙන් සත්ත්ව චරිතානුසාරයෙන් ඉදිරිපත් කරයි.

මෙම ග්‍රන්ථ දෙකෙහිම වැඩිපුර ම පෙනී සිටිනුයේ සත්ත්ව චරිත යි. සත්ත්ව චරිත උපදේශ කථා සඳහා යොදා ගැනීම භාරත උපදේශ සාහිත්‍යයට ආගන්තුක වූවක් නොවේ. සතුන් ආශ්‍රය කොට ගෙන උපදෙස් ලබා දීම උපදේශ කථා සාහිත්‍යයේ මූලික ම ලක්ෂණයකි. බෞද්ධ ජාතක කථාවන්හි ද එය උපයෝගී කරගෙන ඇති ආකාරය සීහචම්ම, කපෝත, කපි, කක්කට, බක ආදී ජාතක කථාවන්ගෙන් සනාථ වේ. බ්‍රහ්ම පුරාණ, විෂ්ණු පුරාණ ආදී ග්‍රන්ථයන්හි ද රාමායණය හා මහාභාරතය යන වීර කාව්‍යන්හි ද දක්නට ලැබෙන උපදේශ කථා සඳහා ද සත්ත්ව චරිත උපයෝගී කොට ගෙන ඇත. මහාභාරතයේ එන එක් උපදේශ කථාවකට අනුව පාණ්ඩවයින් රැවටිය යුත්තේ කපටි සිවලා, ව්‍යාඝ්‍රයා, වෘකයා, තලගොයා, මීයා ආදීන්ගේ උපකාර ලබා ගෙන ඔවුන් රවටා එම ගොදුරු ලබා ගත් ආකාරයෙන් ම බැව් දැක් වේ. පඤ්ච තන්ත්‍රය ද සිවලා, සිංහයා, ගොනා, මීයා, කොකා, කකුළුවා ආදී සත්ත්ව චරිත උපයොගී කර ගනිමින් සදුපදේශ සම්පාදනය කරයි. ඒ අනුව ජාතක කථාවන්හි පැණෙන බොහෝ ජාතක කථා මෙන් ම පඤ්ච තන්ත්‍රය ද එක ම කථා කලාවක් අනුගමනය කොට ගෙන ඇති බව පෙනේ.

එතෙකුදු වුවත් පඤ්ච තන්ත්‍රය හා ජාතක කථාවල මුඛ්‍ය අරමුණු දෙමගක් ඔස්සේ ගමන් කරන බව මෙහිලා සඳහන් කළ යුතු වෙයි. මෙම ග්‍රන්ථ ද්වය ම සදුපදේශ සම්පාදනය කරන බව අවිවාද නමුත් පඤ්ච තන්ත්‍රයේ එන සදුපදේශවල කේන්ද්‍රීය ඉගැන්වීම ලෞකික රාජනීති ධර්මනීති හා බැඳුණකි. ජාතක කථාව සිය සදුපදේශ හරහා පුද්ගල ආධ්‍යාත්මය ලෝකෝත්තර තලයක් කරා රැගෙන යයි. ඒ අනුව පඤ්ච තන්ත්‍රයෙන් ලෞකිකත්වයත් ජාතක කථාවලින් ලෝකෝත්තරත්වයත් නිරූපණය වන බව පැහැදිලි වෙයි.

ජාතක කථාවල මෙන් ම පඤ්ච තන්ත්‍රය රචිත කාලය පිළිබඳ ව විද්වතුන් අතර ඒකමතිකත්වයක් නොමැත. ජාතක බුදුරදුන් ධරමාන අවධියේ ම ප්‍රභවය වී සංවර්ධනයට පත් ව ක්‍රිස්තු වර්ෂ පස් වන සියවස වන විට පූර්ණත්වයට පත් වූ බව සැලකේ. පඤ්ච තන්ත්‍රය ද ක්‍රිස්තු වර්ෂ හතර හෝ පස් වන සියවස්වලට

ඇතැමුන් අයත් කරන නමුත් ඇතැමෙක් එය ඊට පෙරාතුව රචනා වූවක් බව සඳහන් කරති. කෙසේ වෙතත් ආසියාතික කලාපයේ උපදේශ සාහිත්‍යය කෘති අතුරෙන් පඤ්ච තන්ත්‍රයට හා ජාතකට්ඨ කථාවට ප්‍රමුඛතත්වයක් හිමි ව පවතී.

### ගැටලුව

දාර්ශනිකයන් දෙදෙනෙකු තුළ එක හා සමාන චින්තන ධාරා ප්‍රභවය නිසර්ගයෙන් ම සිද්ධ වේ. අරාබි නිසොල්ලාසය, ඊසොප්ගේ උපමා කථා, නස්රුදීන්ගේ කථා, පඤ්ච තන්ත්‍රය, ජාතකට්ඨ කථාව ආදී කෘති දෙස අවධානය යොමු කිරීමෙන් මෙය ප්‍රත්‍යක්ෂ වේ.

මෙහි දී සමස්ත උපදේශ කථා සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය නොකෙරේ. මෙහි අධ්‍යයනය කෙරෙන්නේ පඤ්ච තන්ත්‍රය හා ජාතකට්ඨ කථා පිළිබඳ පමණි. ජාතකට්ඨ කථාවේ හා පඤ්ච තන්ත්‍රයේ කථාවල දක්නට ලැබෙන සමාන මෙන් ම අසමානතා පිළිබඳ අපගේ අවධානය යොමු වේ. එම අධ්‍යයනය තෝරාගත් කථා කීපයක් ආශ්‍රයෙන් ජාතකට්ඨ කථා හා පඤ්ච තන්ත්‍රයේ කථාවල අන්‍යෝන්‍ය වශයෙන් දක්නට ලැබෙන තාර්කික භාවය, විශ්වසනීයත්වය, නිර්මාණාත්මක භාවය, යථාර්ථවාදී ගුණය විමසීමට ලක් කෙරේ. මෙම අධ්‍යයනයට උක්ත ජාතක කථා හා පඤ්ච තන්ත්‍රයේ එන කථා පොදු එක් මූලාශ්‍රයකින් ආභාසය ලබා තිබේ ද? පොදු මූලාශ්‍රයකින් ගොඩනැගී ඇත්නම් ඒ සඳහා එළඹිය හැකි හේතු සාධක කවරේ ද ? යන්න පිළිබඳ අවධානය යොමු කෙරේ. එසේ ම ජාතක හා පඤ්ච තන්ත්‍රාගත සදුපදේශ නූතනත්වය හා ගළපා ගන්නේ කෙසේ ද එහිලා පැණෙන සමාජ හර පද්ධතීන් නූතන සමාජයට නැවත සම්ප්‍රේෂණය කරනුයේ කෙසේ ද යන කේන්ද්‍රීය ගැටලුව මෙහිලා මූලිකව ම සාකච්ඡා කෙරේ.

### සෛද්ධාන්තික රාමුව හා ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ආශ්‍රය කෙරෙන්නේ ජාතකට්ඨකථාව හා පඤ්ච තන්ත්‍රය යි. උක්ත කෘති දෙක ම තුලනාත්මක ව අධ්‍යයනය කොට මූලික පර්යේෂණ ගැටලු ව සඳහා පිළිතුරු හා නිගමන සෙවීමට අපේක්ෂා කෙරේ.

අපගේ අධ්‍යයනය සම්පූර්ණ වශයෙන් ම පුස්තකාල පර්යේෂණයක් ලෙස හඳුන්වා දීම උචිත ය. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය යටතේ පාලි භාෂාවෙන් රචනා කොට ඇති ජාතකට්ඨ කථාව හා සංස්කෘත භාෂාවෙන් රචනා කොට ඇති පඤ්ච තන්ත්‍රය මෙම අධ්‍යයනය සඳහා දායක වේ. මෙම පර්යේෂණයට වක්‍රව මෙන් ම ඍජු ව ආලෝකය සපයන ග්‍රන්ථ, ලිපි ලේඛන ද්විතීයික මූලාශ්‍රය ලෙස අදාළ කර

ගැණේ. ප්‍රධාන වශයෙන් ම ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත මත ම පමණක් පදනම් කර ගනිමින් මෙම පර්යේෂණ කාර්යය සිදු කෙරේ.

## සමාලෝචනය

බෞද්ධ සාහිත්‍යයේ හමුවන ජාතක කථාත් සංස්කෘත සහිත්‍යයේ හමුවන පඤ්ච තන්ත්‍රයත් එක ම උපදේශ කථා සාහිත්‍යයකට ඇතුළත් වෙයි.මෙම කෘති ද්විත්වය ම සමාජය වෙත සදුපදේශ ලබා දීම අරමුණු කොට ගනියි. එසේ ම දෙපොතෙහි ම පැණෙන කථා කලාව පිළිබඳ විමසීමෙන් කෘති ද්වය ම සත්ත්ව චරිතානුසාරයෙන් කථාවන් ඉදිරිපත් කරන බව පෙනේ. ඇතැම් කථාවන්හි එන සන්දර්භය හා හරය පිළිබඳ විමසීමේ දී ද බොහෝ සමානකම් ග්‍රන්ථ ද්වයෙහි ම දැකිය හැකි වෙයි. ඒ අනුව මෙය ජාතක කථා හා පඤ්ච තන්ත්‍ර කථාවල අන්‍යෝන්‍ය වශයෙන් දක්නට ලැබෙන තාර්කිකත්වය, දක්වා ඇති කරුණුවල විශ්වසනීයත්වය, නිර්මාණාත්මක භාවය හා යථාර්ථවාදී ගුණය, සමාන කථා වස්තු ආශ්‍රය කර ගනිමින් සිදු කරන තුලනාත්මක අධ්‍යයනයක් වෙයි. එසේ ම මෙය ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත මත පමණක් පදනම් වෙමින් සිදු කෙරෙන පුස්තකාල පර්යේෂණයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ

*ජාතකට්ඨකථා පඨමො භාගො ඒකක නිපාත වණ්ණනා.* චාල්ස් අල්විස් හේවාවිතාරණ සහ සිරිනාත කුමාරදාස මුනසිංහ, (1926). (සංශෝධිත) විදුරුපොළ පියතිස්ස මහාථෙර. කොළඹ.

*ජාතකට්ඨකථා දුතියො භාගො දුක නිපාත වණ්ණනා,* චාල්ස් අල්විස් හේවාවිතාරණ සහ සිරිනාත කුමාරදාස මුනසිංහ, (1928). (සංශෝධක) විදුරුපොළ පියතිස්ස මහාථෙර. කොළඹ.

*The Panchatantra*, Johannes Hertel Cambridge Massachusetts. (1915). The Barvard University press.

*Panchatantra.* (1940). Pt Guru Prasad Shastri Benares City : Bhargava pustakalaya.